"ජන සවිය දුගී දුප්පත් ජනතාවට ශාරීරික
පෝෂණය ලබාදෙමින් ඔවුන් ස්වශක්තිය
පදනම මත තබා රටේ නිෂ්පාදනය ද වැඩි
දියුණු කිරීමේ වැඩ පිළිවෙලකි."

— ජනාධිපති ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස මැතිතුමා



"JANASAVIYA WILL GIVE STRENGTH
TO THE POOR AND MAKE THEM
SELF-RELIANT SO AS TO GIVE
THEIR BEST TO PRODUCTIVE EFFORT"

— President R. Premadasa

BKT 0193
26/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

**1989.07.22 දින පැවැති මැද කොළඹ එක්සත් ජාතික පක්ෂ විධායක මණ්ඩල රැස්වීම අමතා ජනාධිපති ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින් ජනසවිය වැඩ සටහන විස්තර කරමින් කරන ලද කථාව**

---

මේ අවස්ථාවේ දී වැදගත් කරුණු දෙකක් සම්බන්ධයෙන් අවධානය යොමුවෙලා තිබෙන්නෙ. ඒ කාරණා දෙක ම අපේ මැතිවරණ ප්‍රකාශනයේ අඩංගු අප විසින් ජනතාව ඉදිරියේ තැබූ පොරොන්දු දෙකක්. එකක්, ජනසවිය. තමුන්නාන්සේලාට මතක ඇති අපේ මැතිවරණ ප්‍රකාශනයේ 33 වැනි ඡේදයේ ඉඳල 44 වැනි ඡේදය දක්වා සඳහන් කරල තිබෙන ජනසවිය පිළිබඳව අපේ දර්ශනය. ඒ දර්ශනය තුළින් පිළිවෙල කරගත්ත ප්‍රතිපත්තිය. එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ක්‍රියා දාමය. මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා තමුන්නාන්සේලාගේ නිවෙස්වලට ගියහම ඒ මැතිවරණ ප්‍රකාශනය අරගෙන 23 වැනි ඡේදයේ ඉඳල 44 වැනි ඡේදය දක්වා ජනසවිය පිළිබඳව අප ඉදිරිපත් කළ ඒ දර්ශනයත් ප්‍රතිපත්තියත් ක්‍රියාවලියත් ගැන අවබෝධයක් ලබාගන්න කියල. ඒ ප්‍රතිපත්තිය සඳහන් කරල තිබෙන්නේ ජනතාව ජීවත්කරවීම කියන ශීර්ෂය යටතේ. අපේ ජනාධිපතිවරණයේ දීත් පාර්ලිමේන්තුවරණයේ දීත් අප ඉදිරිපත් කරපු අළුත් දර්ශනයත්, අළුත් ප්‍රතිපත්තියත්, අළුත් ක්‍රියාවලියත් 70 ලක්ෂයක් පමණ මේ රටේ ජීවත්වන දුගී දුප්පත් අසරණ ජනතාව නගා සිටුවීමට අපි ක්‍රියාත්මක කරන ජනසවිය.

එම ප්‍රතිපත්ති මාලාව මහ මැතිවරණයට හා ජනාධිපතිවරණයට ඉස්සරවෙලා ඉදිරිපත් කරනව, අපේ පක්ෂ සම්මේලනයේ දී අනුමත කරන්න. 70 ලක්ෂයක් පමණ මේ රටේ දුගී දුප්පත් ජනතාව ආහාර මුද්දරවලින් ජීවත්වෙනව. හැමදාම ඒ ජනතාව ඒ ආහාර මුද්දරවලින් ජීවත්වෙන්න අරිනව ද? බොහොම සීමාසහිත මුදලක් ලැබෙන්නෙ. පස් දෙනෙක්ගෙන් යුක්ත පවුලකට රු. 300 ක්වත් ලැබෙන්නේ නෑ මාසෙකට. ඒ ලැබෙන ආහාර මුද්දරවලින් පෝෂණයක්වත් ලැබෙන්නෙ නෑ. ඒ ආහාර මුද්දර වලින් ජීවනෝපායක් ලැබෙන්නෙ නෑ. හැමදාම දුගී දුප්පත්භාවයෙන්

දරිද්‍රතාවයෙන් මේ 70 ලක්ෂයක් පමණ ජනතාව ජීවත් වෙනව. ජනගහනයෙන් ½ ක් විතර. ඒ ගැන කල්පනා කරල තමයි මේ ජනසවිය වැඩ පිළිවෙල අපි සකස් කළේ. මීට කලින් මොනම පක්ෂයක්වත්, මොනම රජයක්වත් මේ විදියෙ වැඩ පිළිවෙලක් ජනතාවට ඉදිරිපත් කරල නැහැ. දුගී දුප්පත්කම පෙන්නල දුගී දුප්පත්කම නමැති තුවාලය පාරල, ඒ මගින් ඡන්දය ලබාගෙන බලය ලබාගන්නව මිසක්, මේ තුවාලය සනීප කරන්න කිසිම ස්ථිර ඖෂධයක් ප්‍රතිකාරයක් ඉදිරිපත් කළේත් නෑ. ක්‍රියාත්මක කළේත් නෑ. නමුත් ඕනෑකමින් ම තමන්ගෙ දේශපාලන ප්‍රයෝජනය පිණිස මේ වැඩපිළිවෙල පිළිබඳව වැරදි අදහස් ජනතාව අතරෙ මැතිවරණයේ දීත් පැතිරෙව්ව. දැනුත් පතුරුවනව. අපේ ජනතාව බොහොම බුද්ධිමත් ජනතාවක්. ඒ ජනතාව පිළිගත්ත අපේ අවංකභාවය. අපේ දර්ශනය, අපේ ප්‍රතිපත්තිය. අපේ ක්‍රියා මාර්ගය.

මම කැමතියි, විශේෂ ඉල්ලීමක් කරන්න. අපේ ජනසන්නිවේදන මාධ්‍යයෙන් පුළුවන්කමක් තිබෙනව මේ වැඩපිළිවෙල, මැතිවරණ ප්‍රකාශනය - ජනතාව ජීවත්කරවීමෙයි කියන ශීර්ෂ පාඨය යටතේ තිබෙන 33 වැනි ජේදය ඉදල 44 වැනි ජේදය දක්වා සවිස්තරව සඳහන් කර තිබෙන මේ ජනසවිය පිළිබඳ වැඩපිළිවෙල හැකිනාක් ප්‍රචාරය කරමින් ජනතාවට අවබෝධයක් ලබා දෙන්න කියල. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් තිබෙනව අපි ආණ්ඩුවක් පිහිටුවල අවුරුද්දක් ඇතුලත මේ වැඩපිළිවෙල ආරම්භ කරනව කියල. අපේ ආණ්ඩුව පිහිටුවල අවුරුද්දක් සම්පූර්ණ වෙන්නෙ - ජනාධිපති හැටියට මං දිවුරුම් දුන්නේ 1989 ජනවාරි මාසෙ 02 වෙනිද. එතකොට ලබන අවුරුද්දෙ ජනවාරි මාසෙ වෙනකොටයි ජනාධිපති හැටියට වැඩ භාරගෙන අවුරුද්දක් වෙන්නෙ.

අපේ රජය පිහිටෙව්වෙත් පෙබරවාරි මාසෙ 15 වෙනිද පවත්වපු මහ මැතිවරණයෙ ප්‍රතිඵලය අනුව. පාර්ලිමේන්තුව රැස් උනේ මාර්තු මස 09 වෙනිද. ඊට පස්සේ අයවැය ඉදිරිපත් කළේ. කොයි එක උනත් අපේ මේ පොරොන්දුව අවුරුද්දක් ඇතුලත ක්‍රියාත්මක කරන්න ඕන. නමුත්නාත්සේලාට මම ඉතා ප්‍රීතියෙන් සඳහන් කරන්න කැමතියි මේ වැඩ පිළිවෙල අවුරුද්දක් සම්පූර්ණ වෙනකන් ඉන්නෙ නෑ. සැප්තැම්බර් මාසෙ ක්‍රියාත්මක කරන බව. දැනට ජනසවි බිල්පත් බෙදාගෙනත් යනවා. අපි මුළු ලංකාවේම උප දිසාපති කොට්ඨාශ මට්ටමෙන් මේ ජනසවිය වැඩපිළිවෙල ආරම්භ කරනවා. ආහාර මුද්දරවලින් ජීවත්වෙන උදවියට ජනසවි ලාභය ලැබෙනකන් ආහාර මුද්දර ලැබෙනව. ඒ නිසා අපට පුළුවන්කම

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

තිබෙනව රට පුරාම මේ ජනසවිය ප්‍රතිලාභය ක්‍රමානුකූලව බෙදාදෙන්න. ජනතාවට අමුතු හිරිහැරයක් ඇති වෙන්නෙ නෑ. මන්ද, ඒ ප්‍රතිලාභය ලැබෙන තුරු ආහාර මුද්දරත් ලැබෙනවා. ප්‍රතිලාභය යම් දවසක දෙන්න ආරම්භ උනාද, එය මාස 24 ක් ඇතුළත ලැබෙනව. එයිත් පෝෂණයට රුපියල් 1458 ක් ලැබෙනව. කෑම බීම සහ ඇඳුම් පැළඳුම් සහ අත්‍යවශ්‍ය දේ ලබාගන්න. ඉතිරි 1042 තමන් වෙනුවෙන් තැන්පත් කිරීමට යනව. මාස 24 වෙනුවෙන් රුපියල් 25,000 කටත් අධික අරමුදලක් ලැබෙනව.

අද මේ වැඩපිළිවෙල ගැන විශාල සංවිධානයක් තිබෙනව. ඒ සංවිධානයට අයත් රජයේ අමාත්‍යංශ ගණනාවක්ම ඇතුල් වෙනව. මේක ආහාර මුද්දර වෙනුවට දෙන මුදලකට වඩා අර්ථවත් වැඩපිළිවෙලක්. මේ දුර්වල ශරීර ඇතිව මන්දපෝෂණයෙන් පෙළෙන මේ දරුපවුල්වලට පෝෂණය ලැබෙනවාත් සමග ඒ දරු පවුලට ආදායම් මාර්ග ඇතිවෙන ක්‍රමයකුත් ආරම්භ කෙරෙනව. දැන් මේ දවස්වල ඒ අදාල අමාත්‍යංශ ඒ වැඩපිළිවෙලවල් සකස් කරගෙන යනව. පෝෂණය පිළිබඳ කටයුතු භාරව තිබෙන්නේ කෘෂිකර්ම ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ අමාත්‍යංශයට. දැන් ඒ අමාත්‍යංශය භාර ඇමතිතුමා - ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා ඒ වැඩපිළිවෙලේ නායකත්වය දරණව. මේ වැඩ පිළිවෙල රාජ්‍ය ඇමති හැටියට සම්බන්ධීකරණය කරනව ආහාර කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමති ජී. ඇම්. ප්‍රේමචන්ද්‍ර මැතිතුමා. ඊළඟට මේ වැඩපිළිවෙලට සම්බන්ධීකරණයක් ඇති වෙන අතික් හැම අමාත්‍යංශයක් ම කටයුතු කරනවා. කුමක් සඳහා ද, ඒ අහිංසක දරු පවුල්වලට ජීවන මාර්ගයක් - ජීවන උපායක් සලසා දී අදාල හැම අමාත්‍යංශයක්ම ඊට සම්බන්ධීකරණය වෙනව - ඇතුල් වෙනව. අද තැති බැරි කමින් ඉන්න මේ දරු පවුල් ඇති හැකි අය බවට පත් වෙනව, මේ වැඩ පිළිවෙල ආරම්භ වන මොහොතෙ ඉඳලම. මේ ගැන සම්පූර්ණ විස්තර තමුන්නාන්සේලාට ලබාදීමට අපි තවත් කමිටුවක් පත්කරල තිබෙනව ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමති ඒ. ජේ. රණසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන්. ඉදිරි කාලයේ දී තමුන්නාන්සේලාට මේ පිළිබඳ තොරතුරු අපේ ජනසන්නිවේදන මාධ්‍යයෙන් ලැබෙනවා ඇති. විශේෂයෙන් ම ආහාර මුද්දරවලින් ජීවත්වන ජනතාව ඒ මාධ්‍යයෙන් තේරුම් ගනිවි, තමන්ට නව ජීවනයක් ලැබෙන්නට යන බව. මෙතෙක් කල් දුප්පත්කම නිසා පැත්තකට තල්ලු කරල දාල හිටපු අහිංසක දරු පවුල් මේ සමාජයෙන් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ජාතික ධනය වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙලේ කොටස්කාරයෙක්

බවට පත්වෙන ආකාරය තමුන්නාන්සේලාට අපේ මැති ඇමතිවරු අපේ නිලධාරීන් විස්තර කරල දේවි. එදා අපි, අද අපේ ප්‍රධාන අමුත්තා වන පී. දයාරත්න ඇමතිතුමාගේ ප්‍රදේශයට ගියාම ජනපති ජංගම සේවාව ක්‍රියාත්මක කරන්න, ඒ කාර්යාල පවත්වපු ස්ථානයෙ, අපට ප්‍රදර්ශනයක් දැකගන්න ලැබුණා. එය වෙළෙඳ හා නාවික කටයුතු අමාත්‍යංශයේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක කරපු වැඩ පිළිවෙලක්. ඒ වැඩපිළිවෙලට ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යංශය සහ රජයේ වෙනත් අමාත්‍යංශ සම්බන්ධවෙලා ඉතාමත්ම සිත්ගන්නා අන්දමට, අපේ නැති බැරි අය ඇති හැකි අය බවට පත් කරන ආකාරය පෙන්නා දුන්නා. ඉතාමත්ම සුළු අරමුදලක් උඩ තමන් ඉන්න තිවසේම තමන්ට ජීවනෝපායක් ඇතිකරගන්න පුළුවන් වන ආකාරයට ඒ ප්‍රදර්ශනයෙන් පෙන්නල දීල තිබුණ. ඒකට ඕනකරන මෙවලම්, ඒකට ඕන කරන අමුද්‍රව්‍ය, ඒකට උවමනා කරන අරමුදල් දැන්වීම් මාර්ගයෙන් ලබාගන්න ආකාරය මනුකරල පෙන්නල දීල තිබුණ. දැන් ඒ විදිහෙ විශේෂ වැඩ පිළිවෙලක් විශාල පරිවර්තනයක් අපේ ජන ජීවිතය තුළ තමුන්නාන්සේලාට දකින්න පුළුවන් වෙයි. මේ ජනසවිය වැඩ පිළිවෙල සැප්තැම්බර් මාසෙ ආරම්භ උනාම මේ වැඩ පිළිවෙල උප දිසාපති කොට්ඨාශයෙන් කොට්ඨාශයට ගමන් කරනව, රට පුරා හැම දිස්ත්‍රික්කයකම. ප්‍රථමයෙන් එක උප දිසාපති කොට්ඨාශයක් ගන්නව.

ඔහොම රටපුරාම ගිහින්, අද ආහාර මුද්දරවලින් ජීවත්වන අපේ ජනතාව එක අතකින් ශාරීරික පෝෂණයක් ලබමින් නිරෝගීභාවය ඇති කර ගන්නව. අනික් අතට මෙය කාටවත් අත නොපා ජීවත්වන්න පුළුවන් වන විදිහේ කෘෂිකාර්මික, ආර්ථික, වාණිජ ආදි හැම ක්ෂේත්‍රයකම ආර්ථිකයේ හැම අංශයකටම සම්බන්ධකාමක් ඇති වෙන වැඩපිළිවෙලක්. මේ වැඩපිළිවෙල සවිස්තරව අපේ මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් කර තිබෙනවා. සමහර උදවිය පුදුම වෙනව මැතිවරණයට ඉස්සරවෙලාම මෙ වැනි වැඩ පිළිවෙලක් සවිස්තරව අපේ මැතිවරණ ප්‍රකාශනයට ඇතුල් කිරීම ගැන. අද අමුතු මතක් කිරීමක් අවශ්‍ය නෑ. මේ වැඩපිළිවෙලම මේ මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් වෙලා තිබෙන නිසා.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

**Observations on the Janasaviya Poverty Alleviation Programme by His Excellency R. Premadasa, President, in his address to the Executive Committee Meeting of the Colombo Central UNP Organisation held on 22nd July, 1989.**

Our attention at the moment, remains focussed on two important matters. Both these matters constitute, election promises, we have given to the people. The first is Janasaviya. You will remember that in pargraphs 33 to 44, in our Election Manifesto, we have set out our philosophy about the Janasaviya. In those paragraphs, we have also described in brief, the programme to be implemented based on that vision and the actual process of implementation. I request you to re-read the paragraphs 33 to 44 in the manifesto when you go home and refresh your memory, about the Janasaviya Programme. The Janasaviya policy has been set out in the manifesto, under the heading, "Investing in our Human Base." This is the new vision of development, a new policy and a new programme we put before the people, at the Presidential election and the Parliamentary election. We have decided to implement the Janasaviya Programme, to uplift the living conditions of seven million of our poor, deprived people, living throughout the country.

Before the Presidential and Parliamentary elections, this policy and programmes were approved by our party convention. We know, that in our country, seven million people live on food stamps. Are we to allow all these people to go on living on food stamps always? By way of food stamps, they actually receive, a very limited assistance for their living. A family of five members does not get even so much as Rs. 300 per month. They hardly receive the necessary level of nutrition from the food they can buy, with this meagre assistance. Nor does it assist in any way, to provide them with any stable means of livelihood. As it is, these seven million people will have to live

forever in poverty, with no hope of extricating themselves from its grip. This is about one half of our population. It was after taking into consideration this situation, that the Janasaviya Programme has been formulated. Before this, no party or government, has ever placed before the people, a programme like this. All this time, political parties have only tried to make political capital of this festering sore of poverty, without offering a remedy to cure it. It is only a matter for political propaganda at elections. Even now, some sections are playing the same old political game. But, they cannot deceive the masses of the people, who are quite intelligent. The people realised our sincerity of purpose and reposed their confidence in our vision, policy and programme.

I want to make this important request to you now - please do your best to propagate among the people, the truth about the Janasaviya Programme, which we have set out under the caption "Investing in our Human Base" in paras 33 to 44 in the manifesto, by imparting a proper understanding of it to the people. We have said in our manifesto, that within one year of our forming a government, we would begin implementing this programme. I took my oaths as President, on 2nd January 1989 and it is in January next year, that I will complete one year, in the office of Presidency.

We established our new government, on the basis of the results of the Parliamentary election, held on February 15. The new Parliament met on March 9. We could present the budget only thereafter. We however, must begin implementing this programme within the stipulated year. I am happy to announce today, that we are in a position to begin implementing the Janasaviya Programme, even before the completion of one year and that we will begin implementing it, from this September. We are now distributing among people, the Janasaviya entitlement certificates. At the level of AGA divisions, we will commence implementing the programme, throughout Sri Lanka, simultaneously. Those who now have food stamps, will continue to have them, until they receive Janasaviya assistance. This will enable us, to go about systematically implementing the Janasaviya Programme, throughout the country, without causing any dislocation in the present system of assistance. When a person starts receiving Janasaviya assistance, he will

get it continuously for 24 months. Out of the full allowance, Rs. 1,458/- will be for consumption. They can buy food, clothing etc., with this. The balance Rs. 1,042/- will be deposited in a bank account in the recipient's favour. At the completion of 24 months, there will be a saving of over Rs. 25,000/- for the family.

Today we have created a very wide organisation, for the implementation of the Janasaviya Programme. Several Ministries are participants in it. Janasaviya asistance, is a more meaningful and systematic assistance than the food stamps. When our poor families begin to have adequate nutrition and thereby gain better health and physical strength, a programme will be commenced, to provide them also with a stable means of income. The relevant Ministries are already in the process of preparing the programme. The Ministry of Agriculture, Food and Co-operatives is in charge of the nutrition improvement programme and Hon. Athulathmudali, the Minister is heading the preparation of that programme. Hon. G.M. Premachandra as Minister of State is co-ordinating the activities. Almost all Ministries are getting linked in someway with this programme. For what purpose are they joining hands like this? It is to provide, a stable and lasting means of livelihood, to the helpless families, who are now in the grip of poverty - to make the poor and the weak today, people with some assets and strength.

In order to make all details of the programme and organisatiional work known to you, we have appointed a committee headed by Hon. A. J. Ranasinghe, Minister of State for Information. In time to come, these details and information will be placed before you, through the mass media. Especially, the people receiving the food stamps, will be made to realise, that there is going to be the dawn of a new life for them. Our Ministers and officials will explain to you, how the poor families, who have been all this time ignored and left out in the background, are being brought to the fore and made participants in the process of national production.

The other day, when visiting the electorate of our Chief Guest today, Hon. P. Dayaratne, Minister of Lands, Irrigation and Mahaweli Development, to hold the Presidential Mobile Service, we were afforded the opportunity, of seeing an exhibition, organised by the Ministry of Trade and Shipping. Several

other Ministries, such as the Ministry of Rural Industrial Development too, had participated in it, to make it a success. It was an extremely interesting exhibition and there we found, demonstrated very effectively, how the weak and the poor, could be transformed, into people with considerable assets and strength. It was demonstrated, how tools and implements, funds and other things necessary for the implementation of the Janasaviya Programme, could be found, through effective advertising. When the Janasaviya Programme gets going in coming September, you will be able to witness such a transformation and revolution taking place, in the lives of our people. The basic unit, for the implementation of the Janasaviya Programme, is the AGA area. On this basis, in due time, the implementation process will embrace the whole island. When the Janasaviya Programme is thus implemented, on a wide scale, throughout the country, there will come into being in this country, a people physically strong and healthy and who will energetically engage in various economic activities, which will earn them a good income. Such a people, will not have the need, to stretch out their palm to others for assistance and without doubt, they will be able to lead a dignified life, as citizens of this country. Some people express surprise, that we have included this programme in our election manifesto, with so much detail. But I think, there is no reason for surprise, as it only shows, that we have thought out an effective programme, for the welfare of the people, quite in advance.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

Published by the Presidential Press Secretariat